**ශීර්ෂ 173 - රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014**

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1.1 විගණන විෂය පථය**

රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 අගෝස්තු 13 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.239,800,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.214,420,236 ක් උපයෝජනය කර තිබුණි. ඒ

අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම රු.25,379,764 ක් හෙවත් සියයට 10.6 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 132,800,000 | 125,924,455 | 6,875,545 | 5.18 |
| මුලධන | 107,000,000 | 88,495,781 | 18,504,219 | 17.29 |
| **එකතුව** | **239,800,000** | **214,420,236** | **25,379,764** | **10.6** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 17301 | 3,000,000 | 2,979,672 | 1,000,000 | 1,785,426 | 10,000,000 | 7,388,640 |

## 2 .3 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය රු.1,562,992 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3.1 ඡේදයේ සිට 3.11 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

**3. ශිර්ෂ 173 - රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

**3. 2 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) වැය විෂයයන් 04 ක් සඳහා සළසා තිබුණු රු.3,400,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 14 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ක සිට සියයට 98 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3 අග්‍රිම ගිණුම**

අත්තිකාරම් ලේඛනය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.440,000 ක් වූ තැන්පතු 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 17301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.7,388,640 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01ට අඩු කාල පරාසයකට අදාල විය.

**3.6 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.6.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2015 ජුනි 30 දින වන විටත් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.6.2 අභ්‍යන්තර විගණනය**

-------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණද ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

**-------------------------**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**--------------------------------------**

අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන සෙත්සිරිපාය II අදියර 6 වන මහලේ වූ බිම් ප්‍රමාණයෙන් ¼ ක්, එනම් වර්ග අඩි 5450 ක ඉඩ ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය තුළ නිෂ්ක්‍රියව පැවතුණි .

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**-------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර්17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා 2015 ජූනි 30 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

(ii) 2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

**-------------------------**

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.2,259,581ක් වූ අතර, ඒවා වර්ෂයකට අඩු කාලයකට අදාල විය.

**3.8 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 104(3) | සමාලෝචිත වර්ෂයේ සිදුවූ වාහන අනතුරු 03ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | අමාත්‍යාංශයේ වාහනවල ඉන්ධන දැවීම මාස 06 කට වරක් පරීක්ෂා කර නොතිබුණි. |

**3.9 කාර්යසාධනය**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ පරීක්ෂා කිරීමට සමාලෝචිත වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.10 මුදල් පාලනය**

අමාත්‍යාංශය විසින් මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.11 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 10 | 02 |
| (ii) | ද්විතියික මට්ටම | 73 | 46 | 27 |
| (iii) | ප්‍රාථමික මට්ටම | 20 | 16 | 04 |
| | **එකතුව** | **105** | **72** | **33** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 33 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.